# කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.

## දෙවන වාර පරීක්ෂණය 2019, මාර්තු — 13 ශ්‍රේණිය

**ආර්ථික විද්‍යාව II** | 21 | S | II | පැය තුනයි

සැලකිය යුතුයි :- ♦ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක බැගින් වත් තෝරාගෙන, ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

### I කොටස - "අ" කොටස

01. i. ආර්ථික භාණ්ඩ හා ආර්ථික නොවන භාණ්ඩ අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. හිඟකම යන්නෙන් කුමක් අදහස් වේද? හිඟකම ආවස්ථික පිරිවැය හා සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 4)

iii. හිඟ සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳ ගැටලුව වෙළෙඳපළ ආර්ථික පද්ධතියක හා විධානගත ආර්ථික පද්ධතියක විසඳා ගනු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව හා සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

v. ආර්ථික පද්ධතියක කාර්ය සාධනය ඇගයීමෙහි ලා නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර යොදා ගත හැක්කේ කෙසේදැයි සුදුසු ප්‍රස්තාර සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

02. i. වෙළෙඳපොළේ පවතින සාමාන්‍ය භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් වක්‍රයක් වමේ සිට දකුණට පහළට බෑවුම් වන්නේ ඇයි? (ලකුණු 4)

ii. නිෂ්පාදන සාධක වෙළෙඳපොළ හා භාණ්ඩ හා සේවා වෙළඳපළ අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. මිල ඉල්ලුම් නම්‍යතාව තීරණය කෙරෙන සාධක නම් කරන්න. (ලකුණු 4)

iv. සැපයුම් වක්‍රයක් විතැන්වීමට බලපාන සාධක හඳුනා ගන්න.

v. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන භාණ්ඩයක් සඳහා අදාළ ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 50 - 2P$$
$$Qs = -20 + 8P$$

මෙහි Qd ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයත් Qs සැපයුම් කරනු ලබන ප්‍රමාණයත් P මගින් මිලත් නිරූපණය කරයි.

අ. මෙම වෙළෙඳපොළේ සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

ආ. සමතුලිත මිලේ දී ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 2)

ඉ. පාරිභෝගික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 4)

03. i. අනම්‍ය සැපයුමක් සහිත භාණ්ඩයක් සඳහා රජය විසින් නිෂ්පාදකයන් මත ඒකක බද්දක් පැනවුවහොත් බදු බරින් වැඩි කොටසක් දරනු ලබන්නේ කවුරුන් විසින් ද? යෝග්‍ය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් පිළිතුරු පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. තරඟකාරී වෙළෙඳපොළක අලෙවි කරනු ලබන භාණ්ඩයක් සඳහා අදාළ ඉල්ලුම් සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$$Qd = 300 - 5P$$
$$Qs = -100 + 5P$$

අ. සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කර ප්‍රස්තාර සටහනක දක්වන්න. (ලකුණු 4)

ආ. මෙම භාණ්ඩය සඳහා රජය රු. 10 ක සහනාධාර ලබා දුන්නේ නම්,

a. සහනාධාරයට පසු සැපයුම් වක්‍රය ප්‍රස්තාර සටහනෙහි ඇඳ නව සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

b. සහනාධාරයට පසු නිෂ්පාදන අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 2)

c. සහනාධාරය සඳහා රජයට දැරීමට සිදුවන පිරිවැය කොපමණ ද? (ලකුණු 2)

d. සහනාධාරය හේතුවෙන් අහිමිවන සමාජ සුභසාධනය ගණනය කරන්න. (ලකුණු 2)

iii. රජය විසින් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් සඳහා උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේද? (ලකුණු 4)

04. i. පහත සංකල්පය අතර වෙනස දක්වන්න.

අ. විචල්‍ය පිරිවැය හා ස්ථාවර පිරිවැය


ආ. ආර්ථික ලාභය හා ගිණුම්කරණ ලාභය (ලකුණු 4)

ii. හීනවන එලදානීතිය හා කෙටි කාලීන පිරිවැය අතර ඇති සම්බන්ධතාව ද්විත්ව රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. අ. පරිමාණානුකූල පිරිමැසුම් (Economics of Scale) යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

ආ. පරිමානුකූල පිරිමැසුම් ඇතිවීමට බලපාන හේතු කවරේද? (ලකුණු 4)

iv. පූර්ණ තරඟකාරී ආයතනයක් කෙටි කාලයේදී මුහුණ දෙන පිරිවැය හා අයභාර ව්‍යුහය පහත දැක්වේ.




1. ඒකකයක වෙළෙඳපොල මිල රු. 22ක් නම් ආර්ථික ලාභය හෝ අලාභය ගණනය කරන්න.
2. භාණ්ඩයේ මිල රු.17ක් දක්වා පහත වැටුණේ නම් ආර්ථික ලාභයට හෝ අලාභයට කුමක් සිදුවනු ඇත්ද.
3. ආයතනය වසා දමන ලක්ෂයේදී (Shut down point) ආර්ථික අලාභය කොපමණද?
4. භාණ්ඩයේ මිල රු. 3ක් දක්වා පහත වැටුණේ නම් ආයතනයේ තීරණය කුමක් වනු ඇත්ද?

(ලකුණු 4)

v. සංක්‍රාම ඉපයීම් (Transfer earning ) හා ආර්ථික බදු කුලිය (Economic Rent) අතර වෙනස ජ්‍යාමිතික රූපසටහන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 4)

05. i. සාර්ව ආර්ථික අරමුණු (Marco Economic Goals) මොනවාද? (ලකුණු 4)

ii. ව්‍යාපාර චක්‍ර ( Business Cycles) ඇසුරින්

1. සංකෝචනාත්මක අවධිය (පසුබැසීම/ ප්‍රතිගමනය)
2. පතුල (Trough)
3. ප්‍රසාරණ අවධිය (Expansion)
4. මුදුනත අවධිය (Peak)

පැහැදිලි කරන්න.

(ලකුණු 4)

iii. එක්තරා ආර්ථිකයක 2018 වර්ෂය සඳහා අදාල වන සාර්ව ආර්ථික තොරතුරු සමහරක් පහත වගුවේ දක්වේ.

| | |
|---|---|
| කුටුම්භ පරිභෝජන වියදම | 375 |
| ලාභ අපේක්ෂාවෙන් තොරව කුටුම්භය වෙත සපයන සේවා | 100 |
| අවසාන පරිභෝගික වියදම (FCE) | 500 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 800 |
| ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 400 |
| තොග වෙනස්වීම් | 250 |
| වටිනාකම්හි වෙනස්වීම් | 150 |
| ශුද්ධ අපනයන | 200 |
| ආනයන | 300 |
| විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම | (-100) |
| විදේශ ශුද්ධ ජංගම සංක්‍රම (වර්තන සංක්‍රාම) | 250 |

ඉහත දත්ත ඇසුරින් පහත සඳහන් දෑ ඇස්තමේන්තු කරන්න.

i. රජයේ පරිභෝජන වියදම
ii. වෙළෙඳ පොල මිල අනුව දළ දේශීය වියදම
iii. වෙළෙඳ පොල මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය
iv. වෙළෙඳ පොල මිලට දළ ජාතික ආදායම
v. වෙළෙඳ පොල මිලට වැය කළහැකි දළ ජාතික ආදායම (ලකුණු 5)

iv. පහත සඳහන් සමීකරණ වලින් පිළිබිඹු වන සාර්ව ආර්ථිකයක් සැලකිල්ලට ගන්න. (වටිනාකම රුපියල් මිලියන වලිනි.)

| | | | |
|---|---|---|---|
| පරිභෝජන වියදම | (C) | = | $200 + 0.9yd$ |
| ආයෝජන වියදම | (I) | = | 80 |
| රජයේ වියදම | (G) | = | 300 |
| බදු | (T) | = | 120 |

ඉහත සඳහන් තොරතුරු ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අ. සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න.
ආ. ආයෝජනය රුපියල් මිලියන 200කින් වැඩි වන්නේ නම් සමතුලිත ජාතික ආදායම් මට්ටමට කුමක් වේද?
ඇ. පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම මට්ටම රුපියල් මිලියන 5000ක් වේනම් එම මට්ටම ලඟා කර ගැනීම සඳහා ආයෝජනය කොතරම් ප්‍රමාණයකින් වැඩි කළ යුතුද? (පැවති ජාතික ආදායම(අ) සඳහා ලැබුණු අගය සිතන්න.) (ලකුණු 3)

v. එක්තරා සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය (C) $200 + 0.9yd$ විය. එම ආර්ථිකයේ අයවැය මගින් දැනට පැවති රාජ්‍ය වියදම රු. මිලියන 100කින්ද ස්ථාවර බදු රු. මිලියන 100කින් ද වැඩිකරන ලදී. ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායමට වන බලපෑම දක්වන්න. (ලකුණු 4)

## "ආ" කොටස

06. i. ශ්‍රි ලංකාවේ උද්ධමනය මැනීමට වර්තමානයේ දී භාවිතා වන මිල දර්ශක දෙකක් නම්කර එහි ප්‍රයෝජන නම් කරන්න. (ලකුණු 4)

ii. ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්යයන් කවරේද? (ලකුණු 4)

iii. වාණිජ බැංකු පද්ධතියක කල්පිත ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| වගකීම් (රුපියල් මිලියන) | | වත්කම් (රුපියල් මිලියන) | |
|---|---|---|---|
| ඉල්ලුම් තැන්පතු | 1000 | සංචිත | 200 |
| | | ණය | 800 |
| | 1000 | | 1000 |

තවද මෙම ආර්ථිකයේ මහජනතාව සතු ව්‍යාවහාර මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 1200ක් වන බවත් බැංකු පද්ධතියේ රුපියල් මිලියන 100ක අධිසංචිත පවතින බවත් සලකන්න.

i. ණය මැවීමේ ක්‍රියාවලිය සම්පූර්ණ වූ විට ආර්ථිකයේ තිබිය හැකි උපරිම මුදල් සැපයුම් ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

ii. මහජනතාව වෙතින් ව්‍යවහාර මුදල් ප්‍රමාණයේ වෙනසක් නොමැතිව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 25%ක් දක්වා ඉහළ නංවනු ලැබුව හොත් මුදල් සැපයුමේ උපරිම ප්‍රමාණය ගණනය කරන්න. (ලකුණු 2)

iii. ශ්‍රී ලංකා මහ බැංකුව සක්‍රීය විවට වෙළෙඳ පොළ කටයුතු මගින් මුදල් සැපයුම පාලනය කරන්නේ කෙසේද? (ලකුණු 4)

iv. පොලී අනුපාතිකය අන්තරය යනු කුමක්ද? ශ්‍රී ලංකාවේ පොලී අනුපාතික අන්තරය ඉහළ මට්ටමක පැවතීමට හේතු දක්වන්න. (ලකුණු 4)

07. i. අර්ධ පොදු භාණ්ඩ යනු මොනවාද? ශුද්ධ පොදු භාණ්ඩයකින් අර්ධ පොදු භාණ්ඩයක් වෙනස් වන්නේ කෙසේද? (ලකුණු 4)

ii. නිෂ්පාදනයේ සෘණ බාහිරතා වලදී සිදුවන වෙළඳ පල

අ. අසමත්වීම් යෝග්‍ය ප්‍රස්ථාර සටහනක් ඇසුරින් පහදන්න. (ලකුණු 2)

ආ. බාහිරතා හමුවේ ඇතිවන වෙළඳපල බිඳ වැටීම් මග හරවා ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 2)

iii. බදු අය කිරීමේ සාධාරණත්වය සහ මූලධර්ම සඳහා ඉටුවිය යුතු කොන්දේසි කෙටියෙන් පහදන්න. (ලකුණු 4)

iv. ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ දක්නට ඇති ප්‍රධාන දුර්වලතා මොනවාද? (ලකුණු 4)

v. දේශපාලන අර්බුධ තත්වයන් හේතුවෙන් 2019 වසර සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ ඇයවැය ලේඛනය වෙනුවට අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කෙරුණි. මෙම අතුරු සම්මත ගිණුම යන්නේ කුමක් අදහස් වේද? (ලකුණු 4)

08. I. ලෝකයේ රටවල් අන්තර්ජාතික වෙළදාමට ප්‍රවේශ වීම කෙරෙහි බලපාන වාසි තත්වයන් මොනවාද? (ලකුණු 4)

ii. ස්විට්සර්ලන්තය සහ ජර්මනිය යන දෙරට අදාලව ඔරලෝසු හා රූපවාහිනී යන්ත්‍ර නිපදවීම සම්බන්ධයෙන් ශ්‍රම ඒකක නිමැවුම් පිළිබඳ තොරතුරු පහත වගුවේ නිරූපණය වේ.

| භාණ්ඩය | ස්විට්සර්ලන්තය | ජර්මනිය |
|---|---|---|
| ඔරලෝසු | 40 | 200 |
| රූපවාහිනී | 60 | 100 |

අ. රූපවාහිනී ඒකකයක් නිපදවීමේ අඩුම ආවස්ථික පිරිවැය හිමිකරගන්නේ කිනම් රටක්ද? (ලකුණු 2)

ආ. ඔරලෝසු එකකට රූපවාහිනී අනුපාතය යටතේ සාපේක්ෂව වාසි භාණ්ඩය හුවමාරු කර ගැනීම නිසා දෙරටම නව පරිභෝජන චක්‍රයක් කරා ළඟාවන ආකාරය රූපසටහන් ඇසුරින් දක්වන්න. (ලකුණු 4 )

iii. අ. ආරක්ෂණවාදය වනු කුමක්ද? (ලකුණු 2)

ආ. ආරක්ෂණවාදයට පක්ෂව ඉදිරිපත් කළ හැකි තර්ක මොනවාද? (ලකුණු 2)

iv. අ. භාණ්ඩ වෙළඳ අනුපාතිකය ගණනය කරන්නේ කෙසේද? (ලකුණු 2)

ආ. භාණ්ඩ වෙළඳ අනුපාතිකය අඩු වීමට බලපාන හේතු මොනවාද යි දක්වන්න. (ලකුණු 4)

09. i. ශ්‍රී ලංකාවේ විදේශ සම්පත් පරතරය සෘණ අගයක් ගැනීමට හේතු 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

ii. සෘජු විදේශ ආයෝජන වල වාසි තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

iii. ගෙවුම් ශේෂ ලේඛනයක් යනු කුමක්ද? එය සමන්විත වන ප්‍රධාන ගිණුම් මොනවාද? (ලකුණු 5)

iv. විදේශ සම්පත් පරතරය යනු කුමක්ද යි පැහැදිලි කර විදේශ ලැබීම් වල ප්‍රධාන ශීර්ෂයන් දක්වන්න (ලකුණු 5)

v. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ශ්‍රී ලංකාව මෑත දී ලබාගෙන ඇති ණය පහසුකම් කවරේද? (ලකුණු 5)

10. i. ආර්ථික වෘද්ධියට හේතුවන ප්‍රධාන මූලාශ්‍ර මොනවාද? යන්න පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. මෑත වර්ෂ වල ශ්‍රී ලංකාවේ 7% ක පමණ ආර්ථික වර්ධන වේගයක් ඇතිවීම තීරණය කළ සාධක කවරේද? (ලකුණු 4)

iii. ආර්ථික සංවර්ධනයකදි වැදගත් වන්නේ තිරසර සංවර්ධනයක් අත්කර ගැනිම බව ආර්ථික විශ්ලේෂකයින් පවසයි. තිරසර සංවර්ධනය ලෙස ඔබ හඳුනා ගන්නේ කුමක්ද? ඒ සඳහා අවශ්‍ය කොන්දේසි මොනවාද? (ලකුණු 4)

iv. ජනගහනය රටකට සම්පතකි. ආර්ථික වශයෙන් රටක අක්‍රීය ජන සංඛ්‍යාව වැඩිවීම ඒ රටේ ආර්ථක වෘද්ධියට බලපෑම් සිදුකළ හැකිද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 4)

v. ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති තත්ත්වයෙහි විශේෂ ලක්ෂණ මොනවාද? (ලකුණු 4)